# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන)

**2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා විසින් 2025 සැප්තැම්බර් මස 12 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 සැප්තැම්බර් මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[**34** වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 101.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය***: මේ වගන්තිය මගින් (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය අදාළ වීම ශ්‍රී ලංකාව තුළ පවත්වනු ලබන ක්‍රීඩා ඉසව්වලට සහභාගී වන තැනැත්තන්ට පමණක් සීමා කිරීම වේ.

***3 වන වගන්තිය***: මේ වගන්තිය මගින් තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් සම්බන්ධයෙන් රටෙහි දැනට පවතින නීති යටතේ වරදවල් ලෙස හඳුනාගනු ලැබ ඇති ක්‍රියා සහ ඒ වරදවල් විභාග කිරීම සඳහා මහාධිකරණයට ඇති අධිකරණ බලය ප්‍රධාන ප්‍රඥප්තියෙන් ඉවත් කිරීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටස (3 වන සහ 4 වන වගන්ති) ඉවත් කරනු ලැබේ.

***4 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ක්‍රීඩකයකු වෙත චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) ප්‍රදානය කිරීම සඳහා වූ කොන්දේසි රීති මගින් දැක්වීම පිණිස විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ටීයූඊ කමිටුව විසින් ටීයූඊ ප්‍රදානය කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් සලකා බැලීමේ කාර්යපටිපාටිය පිළිබඳව විධිවිධාන සැලැස්වීම වේ.

***6 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ටීයූඊ කමිටුවේ තීරණය නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩකයා වෙත දැනුම් දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***7 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් (ටීයූඊ) අදාළ නොවන අවස්ථානුගත තත්ත්වයන් නිශ්චිතව දැක්වීම වේ.

***8 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි සිංහල පාඨයේ දෝෂයක් නිවැරදි කිරීම සඳහා සංශෝධනය කරනු ලැබේ.

***9 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පවත්නා විධිවිධාන වඩාත් පැහැදිලිව දැක්වීම සඳහා "IIIඅ වන කොටස" ලෙස "පාලක මණ්ඩලයේ සංයුතිය" යනුවෙන් අලුත් ශීර්ෂයක් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලැබේ.

***10 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ (මේ පනතේ ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලය විසින් (මේ පනතේ ''නියෝජ්‍යායතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම වේ.

***12 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***13 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***14 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මණ්ඩලයේ සාමාජිකයන් බහුතරය විසින් මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***15 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය අඩු කිරීම වේ.

***16 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***17 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***18 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීමේ දී සලකා බලනු ලැබිය යුතු නිපුණතා පිළිබඳ ක්ෂේත්‍ර පුළුල් කිරීම වේ.

***19 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පවත්නා විධිවිධාන වඩාත් පැහැදිලිව දැක්වීම සඳහා ''IIIආ වන කොටස'' ලෙස '' උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් පිළිබඳ විභාග කිරීමට කමිටු සහ මූල මණ්ඩල පිහිටුවීම'' යනුවෙන් අලුත් ශීර්ෂයක් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලැබේ.

***20 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, විනය මූල මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***21 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස ප්‍රතියෝජනය කරනු ලබන අතර, අලුත් IV වන කොටසේ (24, 25, 26, 26අ, 26ආ, 26ඇ, 26ඈ සහ 27 වගන්තිවල) නීතිය බලපෑම වනුයේ -

(අ) ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට එරෙහිව උත්තේජන මර්දන රීති උල්ලංඝනයක් ලෙස කියා සිටීම සම්බන්ධයෙන් සහ විනය මූල මණ්ඩලය විසින් විභාගයක් පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ වන කාර්යපටිපාටිය පිළිබඳව;

(ආ) අභියාචනා මූල මණ්ඩලයක් පත් කිරීම සහ අභියාචනා මූල මණ්ඩලය විසින් අභියාචනා විභාග කිරීම පිළිබඳව;

(ඇ) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳව; සහ

(ඈ) අභියාචනා මූල මණ්ඩලය විසින් ගන්නා ලද අසතුටුදායක තීරණයක ප්‍රතිඵල පිළිබඳව,

විධිවිධාන සැලැස්වීම වේ.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නියෝජ්‍යායතනය විසින් විදේශීය මූලාශ්‍රයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන ලබා ගැනීමේ දී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු බවට නියම කිරීම වේ.

***23 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 31අ සහ 31ආ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එය මේ පනත් කෙටුම්පතේ 16 වන හා 17 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන හා 20 වන වගන්ති ඉවත් කිරීමට ආනුෂංගික වේ.

***24 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා රීති සෑදීමට නියෝජ්‍යායතනයට නියම කිරීම වේ.

***25 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක්, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් දින අනූවක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යවරයාට නියම කිරීම වේ.

***26 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් ඇතැම් අලුත් පද පිළිබඳ අර්ථ නිරූපණ ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලැබේ.

***27 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේ දී කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකා මහාධිකරණය සහ කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණය ඉදිරිපිට ඇති සියලු නඩු කටයුතු ඒ අධිකරණ විසින් විභාග කොට කටයුතු අවසන් කිරීම පිණිස අන්තර්කාලීන විධිවිධාන සලසනු ලබන අතර, එය මේ පනත් කෙටුම්පතේ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටස (3 වන සහ 4 වන වගන්ති) ඉවත් කිරීමට ආනුෂංගික වේ.

## ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන)

එල්.ඩී. - ඕ. 9/2025

## 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක   දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2013 අංක 33 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මේ පනතේ ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 2 වන වගන්තියේ (ඉ) ඡේදයේ ''ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව'' යන වචන වෙනුවට, ''ශ්‍රී ලංකාව තුළ'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටස ඉවත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(1) රීතිවල දක්වනු ලැබ ඇති කොන්දේසි සපුරාලන්නේ නම් පමණක්, රෝගී තත්ත්වයක් ඇති ක්‍රීඩකයකු යම් ක්‍රීඩා ඉසව්වකට සහභාගී වන විට තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීමට ඒ ක්‍රීඩකයාට අවසර

දෙමින් (මේ පනතේ "ටීයූඊ" යනුවෙන් සඳහන් කරනු ලබන) චිකිත්සක භාවිත මුක්තියක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය."; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "අයදුම්පත්‍රයක් අනුමතය අවශ්‍යවන්නා වූ දිනයට පෙරාතුව දින තිහකට නොඅඩු කාලසීමාවක දී" යන වචන වෙනුවට, "ඉල්ලුම්පත්‍රයක් හැකි ඉක්මනින්, සහ තරගය තුළ දී පමණක් තහනම් කරන ලද ද්‍රව්‍ය සඳහා දින තිහකට නොඅඩු කාලසීමාවක දී" යන වචන සහ "ලේඛණ ඉදිරිපත් කළ යුතු ය." යන වචන වෙනුවට "ලේඛන ඉදිරිපත් කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2), (3), (4) සහ (5) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

"(2)(අ) චිකිත්සක භාවිත මුක්තිය පිළිබඳ කමිටුව (ටීයූඊ කමිටුව) සායනික, ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය විද්‍යාව පිළිබඳ පළපුරුද්දක් සහිත තැනැත්තන් විය යුතු සාමාජිකයන් තුන්දෙනකුට නොඅඩු ගණනකින් සමන්විත විය යුතු ය. එකී සාමාජිකයන් අතරින් එක් තැනැත්තකු සෞඛ්‍යය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපදේශකවරයාගේ නියෝජිතයකු විය යුතු ය.

(ආ) සාමාජිකයන් විසින්, තමා පත් කරනු ලබන අවස්ථාවේ දී, යම් සම්බන්ධතා පිළිබඳ ගැටුමක් පැවතීමට ඉඩ ඇත් නම් ඒ පිළිබඳව අනාවරණය කළ යුතු ය. 10 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබ ඇති ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එවිට ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කිරීමට පියවර ගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සමාලෝචනය සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසුව, ටීයූඊ කමිටුව විසින් ඒ ඉල්ලුම්පත්‍රය චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) සඳහා සහාය වන සාක්ෂි සහ ලේඛන ද සමඟ සලකා බලා, ක්‍රීඩකයා විසින් ඉල්ලා ඇති චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කිරීමේ හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමේ තීරණය ගත යුතු ය.

(4) ස්වකීය තීරණයට එළඹීමේ දී ටීයූඊ කමිටුව විසින් රීතිවල විධිවිධාන සලසා ඇති පරිදි චිකිත්සක භාවිත මුක්තීන් සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල විධිවිධාන අනුගමනය කළ යුතු ය.

(5) ටීයූඊ කමිටුව විසින් ස්වකීය තීරණය, ඒ තීරණය සඳහා වූ හේතු ද සමඟ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“*චිකිත්සක භාවිත මුක්තියෙහි (ටීයූඊ හි) අදාළ කොන්දේසි සඳහන් කළ යුතු බව.*

**7.** (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ටීයූඊ කමිටුවේ තීරණය වහාම ක්‍රීඩකයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කරන්නා වූ තහනම් කරන ලද ද්‍රව්‍ය හෝ තහනම් කරන ලද ක්‍රමය සහ එසේ ප්‍රදානය කරන ලද මුක්තිය අදාළ වන කාලසීමාව ද වෙනත් යම් කොන්දේසි ද චිකිත්සක භාවිත මුක්තියෙහි (ටීයූඊ හි) පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) 6 වන වගන්තිය යටතේ ටීයූඊ කමිටුවේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 26 වන වගන්තිය යටතේ පත් කරන ලද අභියාචනා මූල මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.''.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"චිකිත්සක භාවිත මුක්තියෙහි (ටීයූඊ හි) වලංගුභාවය.

**8.** මේ කොටසේ විධිවිධානවලට අනුව ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ)-

(අ) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් අවශ්‍යතාවලට හෝ කොන්දේසිවලට යටත්ව ද ඒ අවශ්‍යතාවලට හෝ කොන්දේසිවලට අනුකූලව ක්‍රීඩකයා කටයුතු නොකරන අවස්ථාවක දී;

(ආ) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කරන ලද කාලසීමාව ඉකුත් වී ඇති අවස්ථාවක දී; හෝ

(ඇ) රීතිවලට අනුකූලව ටීයූඊ කමිටුවේ තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබ ඇති අවස්ථාවක දී,

අදාළ නොවිය යුතු ය.''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ආ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම්වලට එරෙහිව පියවර ගැනීමට;".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් ශීර්ෂයක් ඇතුළත් කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් ශීර්ෂය මෙයින් ඇතුළත් කරනු ලැබේ:-

"IIIඅ වන කොටස

**පාලක මණ්ඩලයේ සංයුතිය**".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) නියෝජ්‍යායතනයේ කටයුතු අධීක්ෂණය කිරීම (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පරිපාලනය කිරීමේ" යන වචන වෙනුවට "අධීක්ෂණය කිරීමේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"නියෝජ්‍යායතනයේ අධීක්ෂණය මණ්ඩලය වෙත පැවරිය යුතු බව.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන්, එනම් -

(i) ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක් දරන නිලධරයකු;

(ii) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(iii) ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(iv) නීතිපතිවරයා විසින් නම් කරනු ලබන, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාගේ නිලයට වඩා අඩු නොවන නිලයක් දරන නිලධරයකු; සහ

(v) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක් දරන නිලධරයකු; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නීතිය, වෛද්‍ය විද්‍යාව හෝ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රයක විශිෂ්ටත්වයට පත් වූ, අවම වශයෙන් වසර පහළොවක අත්දැකීම් සහිත (මේ පනතේ “පත් කළ සාමාජිකයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් දෙදෙනකු.

(2) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගේ බහුතරයක තීරණයේ නිර්දේශය මත, පත් කළ සාමාජිකයන්ගෙන් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය. එසේ පත් කරනු ලැබූ සභාපතිවරයා වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.”.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඉවත් කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ඉවත් කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ “අමාත්‍යවරයා සලකන්නේ නම්, අමාත්‍යවරයා විසින්,” යන වචන වෙනුවට, “මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් බහුතරය සලකන්නේ නම්, මණ්ඩලය විසින්,” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ “හතර දෙනකු” යන වචන වෙනුවට, “තුන් දෙනකු” යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව" යන වචන වෙනුවට, "මණ්ඩලයේ බහුතර සාමාජිකයන්ගේ අනුමතය ඇතිව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්යපටිපාටිය විධිමත් කිරීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ඉවත් කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ඉවත් කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වෛද්‍ය හෝ ක්‍රීඩා වෛද්‍ය ක්ෂේත්‍රවල" යන වචන වෙනුවට, "වෛද්‍ය විද්‍යාව, නීතිය, ක්‍රීඩා පරිපාලනය හෝ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රයක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනතේ විධිවිධාන යටතේ සහ ඒ යටතේ සාදනු

ලබන රීතිවලට සහ නියෝගවලට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.”.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් ශීර්ෂය මෙයින් ඇතුළත් කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් ශීර්ෂයක් ඇතුළත් කිරීම

“IIIආ වන කොටස

**උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් පිළිබඳ විභාග කිරීමට කමිටු සහ මූල මණ්ඩල පිහිටුවීම**”.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ “යම් කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයකු” යන වචන වෙනුවට, “යම් කමිටුවක සාමාජිකයකු හෝ 26 වන වගන්තිය යටතේ පත් කරන ලද අභියාචනා මූල මණ්ඩලය හැර මූල මණ්ඩලයක සාමාජිකයකු” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ “ජාතික නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලනය, ජාතික ක්‍රීඩා සංගමය, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ක්‍රීඩකයා හෝ පරිවාර පිරිසේ සාමාජිකයකුට” යන වචන වෙනුවට, “ක්‍රීඩකයාට හෝ ක්‍රීඩකයාගේ සහායක පිරිසට, නියෝජ්‍යායතනයට, ජාත්‍යන්තර සම්මේලනයට, ජාතික ක්‍රීඩා සංගමයට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට (WADA)” යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ “ක්‍රීඩකයකුට හෝ පරිවාර පිරිසේ යම් සාමාජිකයකුට” යන වචන වෙනුවට, “ක්‍රීඩකයාට හෝ ක්‍රීඩකයාගේ සහායක පිරිසට” යන වචන සහ “එම ක්‍රීඩකයා හෝ අදාළ තැනැත්තා” යන වචන වෙනුවට, “එම ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ සහායක පිරිස” යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (ක) ඡේදයේ “ක්‍රීඩකයාට හෝ අදාළ තැනැත්තාට” යන වචන වෙනුවට, “ක්‍රීඩකයාට හෝ ක්‍රීඩකයාගේ සහායක පිරිසට” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඉ) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ “ක්‍රීඩකයා හෝ පරිවාර පිරිසේ යම් සාමාජිකයකුට, නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලනය, ජාතික ක්‍රීඩා සංගමය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) වෙත” යන වචන වෙනුවට, “ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තාට, නියෝජ්‍යායතනයට, ජාත්‍යන්තර සම්මේලනයට, ජාතික ක්‍රීඩා සංගමයට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට (WADA)” යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(2) මණ්ඩලය විසින්, (මේ පනතේ “විනය මූල මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී ලංකා උත්තේජක මර්දන විනය මූල මණ්ඩලය” යනුවෙන් හඳුන්වනු ලබන, මූල් අවස්ථා විභාග කිරීමේ මණ්ඩලයක් සංස්ථාපනය විය යුතු සාමාජික සංචිතයක් පත් කරනු ලැබිය යුතු ය. ඒ සංචිතය -

(අ) අධිකරණයේ පෙනී සිටීම පිළිබඳව වසර පහකට වඩා වැඩි පළපුරුද්දක් ඇති නීතිඥවරුන් අතරින් තෝරාගනු ලබන තැනැත්තන් දෙදෙනකුගෙන්;

(ආ) ක්‍රීඩා වෛද්‍ය ක්ෂේත්‍රයේ වසර පහකට වඩා වැඩි පළපුරුද්දක් ඇති වෛද්‍ය වෘත්තිකයන් අතරින් තෝරාගනු ලබන තැනැත්තන් තිදෙනකුගෙන්; සහ

(ඇ) ක්‍රීඩා පරිපාලනය පිළිබඳව පූර්ව පළපුරුද්දක් තිබිය යුතු තැනැත්තන් තිදෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.''; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, ඒ වගන්තියේ (3), (4) සහ (5) වන උපවගන්ති ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

''(3) අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාමාජිකයන් අතරින් එක් අයකු විනය මූල මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයා විසින් විනය මූල මණ්ඩලයක අනෙකුත් සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු අතර, එහි සාමාජික සංඛ්‍යාව සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් තිදෙනකු නොඉක්මවිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් විනය මූල මණ්ඩලයේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.''.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස ප්‍රතියෝජනය කිරීම

"IV වන කොටස

**උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන විනයානුකූල කාර්යපටිපාටිය සහ අභියාචනා කාර්යපටිපාටිය**

උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කරන අවස්ථා.

**24.** රීති යටතේ පිහිටුවන ලද පූර්ව විනිශ්චය කාර්යපටිපාටි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, නියෝජ්‍යායතනය විසින්, සාක්ෂිමය තොරතුරු මත පදනම්ව සෑහීමකට පත්වීමෙන් පසුව, ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් රීතිවල දක්වා ඇති උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කර ඇති බවට කියා සිටිනු ලැබිය හැකි ය.

උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව නියෝජ්‍යායතනය විසින් කියා සිටී නම් ගත යුතු පියවර.

**25.** (1) නියෝජ්‍යායතනය විසින් 24 වන වගන්තිය යටතේ කරන ලද යම් කියා සිටීමක් ලිඛිතව අදාළ ක්‍රීඩකයාට හෝ ඒ වෙනත් තැනැත්තාට දැනුම් දිය යුතු ය. නියෝජ්‍යායතනය විසින්, අදාළ වන විට, අදාළ විදේශීය ජාතික උත්තේජක මර්දන ආයතනය, ජාත්‍යන්තර සම්මේලනය, ජාතික ක්‍රීඩා සංගමය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) වෙත ද දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍යායතනය විසින් එවැනි කියා සිටීමක් සිදු කරන අවස්ථාවක දී සහ ක්‍රීඩකයා හෝ ඒ වෙනත් තැනැත්තා රීති යටතේ විධිවිධාන සලස්වා ඇති කාලය තුළ විභාගයක් සඳහා ඇති අයිතිය අත් නොහරින අවස්ථාවක දී, නියෝජ්‍යායතනය විසින්, 23 වන වගන්තිය යටතේ පත් කරන ලද විනය මූල මණ්ඩලයට දැනුම් දිය යුතු අතර, රීතිවල නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව විභාගයක් පවත්වන ලෙසට ඉල්ලා සිටිය යුතු ය.

(3) නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමට අදාළ වන්නා වූ, ඔවුන් සතුව පවතින සියලු ලේඛන විනය මූල මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) විනය මූල මණ්ඩලය විසින්, සියලු ලේඛන සහ සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව ස්වකීය තීරණය ලබා දිය යුතු අතර, ඒ තීරණය නියෝජ්‍යායතනය වෙත සහ ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ සහායක පිරිස වෙත දැනුම් දිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කියා සිටින ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය සිදු කරන ලදැයි චෝදනා ලබා ඇති ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තා විසින්, 26 වන වගන්තිය යටතේ පත් කරන ලද අභියාචනා මූල මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

අභියාචනා මූල මණ්ඩලයක් පත් කිරීම.

**26.** (1) අමාත්‍යවරයා විසින් (මේ පනතේ "අභියාචනා මූල මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) උත්තේජක මර්දන අභියාචනා මූල මණ්ඩලය පිහිටුවීම පිණිස, නීතිය හෝ වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රයක විශිෂ්ටත්වයට පත්ව ඇති සාමාජිකයන් සය දෙනකුගෙන් යුත් සංචිතයක් පත් කරනු ලැබිය යුතු ය. අභියාචනා මූල මණ්ඩලය විසින්, අවශ්‍ය අවස්ථාවල දී යම් විශේෂිත කාරණයක් හා සම්බන්ධ අදාළ ක්ෂේත්‍රයෙහි අවශ්‍ය දැනුම සහ නිපුනතාව සහිත යම් තැනැත්තකු, සාමාජිකයකු ලෙස මූල මණ්ඩලයට අනුයුක්ත කර ගනු ලැබිය හැකි ය.

(2) අභියාචනා මූල මණ්ඩලය විසින්, ඊට ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් රීතිවලට අනුකූලව විභාග කොට නිශ්චය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

ටීයූර් කමිටුවේ තීරණයක් සම්බන්ධයෙන් වන අභියාචනා.

**26අ.** ටීයූර් කමිටුවේ තීරණයකින් අභියාචනා මූල මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනයක්, රීති මගින් විධිවිධාන සලස්වා ඇති කාලසීමාව තුළ සහ එසේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ජාතික මට්ටමේ ක්‍රීඩකයකු හෝ ජාත්‍යන්තර නොවන ඉසව්වක් සම්බන්ධ වන විනය මූල මණ්ඩලයේ තීරණයක් සම්බන්ධයෙන් වන අභියාචනා.

**26ආ.** (1) 25 වන වගන්තිය යටතේ විනය මූල මණ්ඩලයේ තීරණයක් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකුට හෝ ජාත්‍යන්තර ඉසව්වකට සම්බන්ධ නොවන අවස්ථාවක දී, ඒ තීරණයට විරුද්ධව අභියාචනා මූල මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය, රීතිවල නිශ්චිතව දක්වා ඇති පාර්ශ්වවලට තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විනය මූල මණ්ඩලයේ තීරණයකට විරුද්ධව වෙනත් යම් පාර්ශ්වයක් විසින් අභියාචනා ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් ඒ තීරණය සම්බන්ධයෙන් අභියාචනා මූල මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් තොරව ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත සෘජුව ම අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ අභියාචනා මූල මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් රීතිවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් අභියාචනා මූල මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන

අභියාචනයක්, රීතිවල නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු හෝ ජාත්‍යන්තර ඉසව්වක් සම්බන්ධ වන විනය මූල මණ්ඩලයේ තීරණයක් සම්බන්ධයෙන් වන අභියාචනා.

**26ඇ.** 25 වන වගන්තිය යටතේ විනය මූල මණ්ඩලයේ තීරණයක් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකුට හෝ ජාත්‍යන්තර ඉසව්වකට සම්බන්ධ වන අවස්ථාවක දී, ඒ තීරණයට විරුද්ධව ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත සෘජුව ම අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය, රීතිවල නිශ්චිතව දක්වා ඇති පාර්ශ්වවලට තිබිය යුතු ය.

අභියාචනා මූල මණ්ඩලයේ තීරණයක් සම්බන්ධයෙන් වන අභියාචනා.

**26ඈ.** (1) අභියාචනා මූල මණ්ඩලයේ තීරණවලට විරුද්ධව 33 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි, ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය මගින් සහ ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිති මගින් අවසර දී ඇති අවස්ථානුගත තත්ත්වයන් සම්බන්ධයෙන් සහ ඉන් අවසර දී ඇති පාර්ශ්වයන් විසින් පමණක් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය විධාන කරන්නේ නම්, (1) වන උපවගන්තියේ සඳහන් යම් පාර්ශ්වයක් වෙත අදාළ තොරතුරු ලබා දීම නියෝජ්‍යායතනයෙහි කාර්යය විය යුතු ය.

අභියාචනා මූල මණ්ඩලය විසින් දෙන ලද අසතුටුදායක තීරණයක ප්‍රතිඵල.

**27.** යම් ක්‍රීඩකයකු රීතිවලට පටහැනිව ක්‍රියා කර ඇති බවට සොයාගනු ලැබ ඇති අවස්ථාවක දී, රීතිවල අදාළ විධිවිධාන ප්‍රකාරව ඒ ක්‍රීඩකයාට දඬුවම් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ලැබෙන යම් සියලු මුදල්," යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ලැබෙන යම් සියලු මුදල්:

එසේ වුව ද, නියෝජ්‍යායතනය විසින් සියලු විදේශ පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය,".

ප්‍රධාන ප්‍රඥප්තියට 31අ සහ 31ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 31අ සහ 31ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"නියෝජ්‍යායතනය දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**31අ.** නියෝජ්‍යායතනය 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

නියෝජ්‍යායතනයේ සාමාජිකයන්, නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**31ආ.** නියෝජ්‍යායතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) නියෝජ්‍යායතනය විසින්, සිය බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුකූලව ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා රීති සාදනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "දින හැටක කාලසීමාවක් ඉක්මවීමට පෙරාතුව" යන වචන වෙනුවට "දින අනූවක් ඉකුත්වීමට පෙරාතුව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ක්‍රීඩකයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""ක්‍රීඩකයාගේ සහායක පිරිස" යන්නෙන්, යම් ක්‍රීඩා පුහුණුකරුවකු, අභ්‍යාසකයකු, කළමනාකරුවකු, නියෝජිතයකු, කණ්ඩායම් කාර්යමණ්ඩලය, නිලධරයකු, වෛද්‍ය හෝ පරිපූරක වෛද්‍ය පිරිස, ක්‍රීඩා තරගයට සහභාගී වීමට හෝ සූදානම් වීමට ක්‍රීඩකයා සමඟ වැඩකරන, කටයුතු කරන හෝ ක්‍රීඩකයාට සහාය දක්වන මවක් හෝ පියෙකු හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;";

(2) "සීඑස්" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(3) "නීති සංග්‍රහය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(4) "තරඟය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය" යන්නෙන්, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව විසින් පිහිටුවන ලද ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය අදහස් වේ;";

(5) "තරඟ තුළ දී පරීක්ෂා කර බැලීම" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන්:-

""තරඟ තුළ දී" යන්නෙන්, ක්‍රීඩකයා සහභාගී වීමට නියමිත තරඟයකට පෙර දින ප.ව. 11.59 ට ආරම්භ වී, ඒ තරඟය අවසන් වීම තෙක් වූ කාලසීමාව සහ ඒ තරඟයට අදාළ සාම්පල එකතු කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ;

"තොරතුරු" යන්නට, දත්ත, පාඨ, ප්‍රතිබිම්බ, ශබ්ද, කේත, දත්ත ගබඩා හෝ සූක්ෂම චිත්‍රපට ඇතුළත් වේ;

"ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයා" යන්නෙන්, පරීක්ෂා කිරීම සහ විමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව, එක් එක් ජාත්‍යන්තර සම්මේලනය මගින් නිර්වචනය කර ඇති පරිදි වූ ජාත්‍යන්තර මට්ටමේ තරඟයක දී තරඟ කරන ක්‍රීඩකයකු අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, ස්වාභාවික තැනැත්තකු හෝ සංවිධානයක් හෝ අස්තිත්වයක් අදහස් වේ;";

(6) "ක්‍රීඩා සංවිධානය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්;

(7) "චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ)" සහ "භාවිත" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ පිළිවෙළින් ආදේශ කිරීමෙන්:-

""චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ)" යන්නෙන්, මේ පනතේ II වන කොටස සම්බන්ධයෙන් වන විට, 33 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවල දක්වා ඇති පරිදි ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයට සහ චිකිත්සක භාවිත මුක්තිය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව රෝගී තත්ත්වයක් ඇති ක්‍රීඩකයකුට ප්‍රදානය කරන ලද මුක්තියක් අදහස් වේ;

"භාවිත කිරීම" යන්නෙන්, යම් තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් කවර හෝ ආකාරයකින් උපයෝගී කර ගැනීම, ආලේප කිරීම, ශරීරගත කිරීම, නික්ෂේපණය හෝ පරිභෝජනය කිරීම අදහස් වේ;"; සහ

(8) "ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA)" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය එකතු කිරීමෙන්:-

""ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය" යන්නෙන්, 2003 මාර්තු මස 5 වන දින කොපන්හේගන්හි දී ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් සම්මත කර ගන්නා ලද කලින් කලට සංශෝධිත පරිදි වූ ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය අදහස් වේ.".

අන්තර්කාලීන විධිවිධාන

**27.** මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකා මහාධිකරණය හෝ කොළඹ දී පවත්වනු ලබන, බස්නාහිර පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පළාත්බද මහාධිකරණය ඉදිරියේ පවරන ලදුව මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග කිරීමට ඇති සියලු සිවිල් නඩු, අපරාධ නඩු, නඩු, නඩු කටයුතු, කාරණා හෝ දේ එය පවරනු ලැබ ඇත්තේ පනතේ කවර විධිවිධානයක් යටතේ ද ඒ විධිවිධාන යටතේ ඒ අධිකරණය විසින් විභාග කර අවසන් කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.